# දැන්වීම් පුරප්පාඩු

## සී/ස ගල්ගමුව විවිධ සේවා සමුපකාර සමිතිය

## අනුරාධපුර පාර - ගල්ගමුව

සී/ස ගල්ගමුව විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා ගල්ගමුව / ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවල ස්ථිර පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දේ.)

| අ.අ. | තනතුර | වැටුප් සංකේත | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | |
|---|---|---|---|---|---|
| | | | | බාහිර බඳවා ගැනීම් (විවෘත) | අභ්‍යන්තර බඳවා ගැනීම් (සීමිත) |
| 01 | කළමනාකරු මානව සම්පත් (සමාජික හා ප්‍රජා සංවර්ධන) | TSL | 26,100/-<br>375X10<br>45X11<br>525X10<br>40,050/- | අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මානව සම්පත් කළමනාකරණය හෝ ප්‍රජා සංවර්ධනය හෝ විෂය සහිතව, කළමනාකරණය පිළිබඳව උපාධියක් ලබා තිබීම සමග රැකියා ක්ෂේත්‍රයට අදාළ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 01 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ<br>ආ) පිළිගත් ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත මානව සම්පත් කළමනාකරණය හෝ ප්‍රජා සංවර්ධනය හෝ පිළිබඳව ඩිප්ලෝමාවක් සමත් වීම හෝ සමග රැකියා ක්ෂේත්‍රයට අදාළ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 04 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. | අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ධාරාවක් යටතේ උපාධියක් ලබා තිබීම සමග SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 04 කට හෝ OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ<br>ආ) පිළිගත් ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත මානව සම්පත් කළමනාකරණය හෝ ප්‍රජා සංවර්ධනය හෝ පිළිබඳව ඩිප්ලෝමාවක් සමත් වීම හෝ සමග SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 04 කට හෝ OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ<br>ඇ) ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (උසස් පෙළ) පාඨමාලාව විෂයන් 03 කට සම්මාන සහිතව සියලු විෂයයන්ගේ සමත්වීම සමග SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 10 කට හෝ OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 15 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |
| 02 | බැංකු කළමනාකරු | SL | 23,000/-<br>320X10<br>375X11<br>500X10<br>35,325/- | අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 9 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත බැංකු කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත්වීම හෝ ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අදියර II සමත්වීම හෝ ඊට ඉහළ සුදුසුකම් සපුරා තිබීම සමග ගිණුම් කටයුතු පිළිබඳව වසර 02 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ<br>ආ) ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු සහ මූල්‍ය සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම සමග රැකියා ක්ෂේත්‍රයට අදාළව අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 3 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම් | අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 9 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත බැංකු කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත්වීම හෝ<br>ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අදියර II සමත්වීම හෝ සමග OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ<br>ආ) ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු සහ මූල්‍ය සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම සමග OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ<br>ඇ) ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (උසස් පෙළ) පාඨමාලාව විෂයයන් 02 කට සම්මාන සහිතව සියලු විෂයයන්ගේ සමත්වීම සමග OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 10 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ<br>ඈ) OL වැටුප් පරිමාණයේ සහකාර බැංකු කළමනාකරු තනතුරේ 1 වන ශ්‍රේණියේ වසර 10 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |
| 03 | විගණක සහාකාර | OL | 20,000/-<br>225X10<br>270X11<br>320X10<br>28,420/- | අ) අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයෙන් ගණිතය,සිංහල / දෙමළ ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත් වීම. | අ) ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පාඨමාලාව සමත්වීම සමග MSSL (T) වැටුප් පරිමාණයේ හෝ MSSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 10 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |
| 04 | රියදුරු | MSSL (T) | 19,000/-<br>185X10<br>225X11<br>270X10<br>26,025/- | අ) අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත්වීම සමග මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන වසර 03 කට වඩා පැරණි වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.<br>(බඳවා ගන්නා අවස්ථාවේදී රිය පැදවීම පිළිබඳව ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම.)<br>• බරවාහන රියදුරු බලපත්‍රයක් තිබීම විශේෂ සුදුසුකමකි. | අ) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන වසර 03 කට වඩා පැරණි වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම සමග MSSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>(බඳවා ගන්නා අවස්ථාවේදී රිය පැදවීම පිළිබඳව ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් විය යුතුය.)<br>• බරවාහන රියදුරු බලපත්‍රයක් තිබීම විශේෂ සුදුසුකමකි. |

1. ඉහත තනතුරු ස්ථිර තනතුරු වේ. විශ්‍රාම වැටුප් සහිත සේවක අර්ථසාධක අරමුදලට , සේවක භාරකාර අරමුදලට හිමිකම් ඇති තනතුරු වන අතර, සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් වරින් වර ලබාදෙන දීමනා සඳහා හිමිකම් ඇත.
2. මෙම බඳවා ගැනීම් වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 3/2020 වැටුප් හා බඳවා ගැනීමේ චක්‍රලේඛයට අනුකූල වේ.

**බඳවා ගැනීමට අදාළ වෙනත් සුදුසුකම්**

- සියලුම අයදුම්කරුවන් ගල්ගමුව / ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විය යුතුයි.
- මේ සඳහා ඉහත සුදුසුකම් සපුරා ඇති වයස අවුරුදු 18 ත් 45 ත් අතර ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයටම අයදුම්පත් ඉදිරිපත් කළ හැක. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහත වයස් සීමාව අදාළ නොවේ.)
- තමන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, ග්‍රාම නිලධාරී සහතිකය, සියලුම අධ්‍යාපන සහතික, වෘත්තීය සුදුසුකම් හා අනෙකුත් සහතිකවල ඡායා පිටපත්ද සමග අමුණා ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනය එවිය යුතුයි.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2024.02.26 දිනය වේ. මෙම දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. තනතුරු කිහිපයකට අයදුම් කරන්නේනම් ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් යොමු කළ යුතුය.

**සභාපති, සී/ස ගල්ගමුව විවිධ සේවා සමුපකාර සමිතිය,**
**අනුරාධපුර පාර, ගල්ගමුව.**

**විමසීම් - 037-2253008**